# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ග්‍රේෂන් බුද්ධික විජේසිංහ
අංක E/2/5,
සමගිපුර මහල් නිවාස
ග්‍රෑන්ඩ්පාස්
කොළඹ 14

<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**2154/2020**

එදිරිව

පොලිස් මූලස්ථානය
කොළඹ 01

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස

**පෙනී සිටීම :**

අභියාචක සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් සහකාර පොලිස් අධිකාරි (කොළඹ මධ්‍යම 1) කේ. කිරිඇල්ල මයා, ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.ඩබ්.එස්.පී ද සිල්වා මයා (ස්ථානාධිපති-පිටකොටුව) සහ උප පොලිස් පරීක්ෂක ඩබ්.ඩී ආරියසිංහ මයා (පොලිස් ස්ථානය-පිටකොටුව) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - 2020.09.01, 2022.01.31

පොදු අධිකාරිය - 2021.03.20

**විභාග කළ දිනය :** 2020.11.30, 2021.01.11, 2021.03.22, 2022.04.20, 2022.08.22

**තීරණය කළ දිනය :** 2022.08.22

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2019.08.02 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

1. *පොලිස් මූලස්ථානයේ මහජන සහන මැදිරියට කරන ලද 2018 09.01 දිනැති CIB(ii) 94/3 දරන පැමිණිල්ල සහ පැමිණිල්ලට අදාළව පිටකොටුව පොලිස් ස්ථානය, සහකාර පොලිස් අධිකාරී, පොලිස් අධිකාරි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නියෝජ්‍ය පොලිස්පති,*

*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් එවන ලද වාර්තා පොලිස් නිරීක්ෂණ සටහන් සහ නිර්දේශ යවනු ලැබූ ලිපි ඇතුළු සම්පූර්ණ ගොනුවේ සහතික පිටපත්.*

2. *පොලිස් මූලස්ථානයේ මහජන සහන මැදිරියට කරන ලද 2018.08.18 දිනැති CIB(ii) 363/49 දරන පැමිණිල්ල සහ පැමිණිල්ලට අදාළව පිටකොටුව පොලිස් ස්ථානය, සහකාර පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී/ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් එවන ලද වාර්තා පොලිස් නිරීක්ෂණ සටහන් නිර්දේශ යවනු ලැබූ ලිපි ඇති සම්පූර්ණ ගොනුවේ සහතික පිටපත්.*

3. *පොලිස් මූලස්ථානයේ මහජන සහන මැදිරියට කරන ලද 2019/07/23 දිනැති CIB (i) 342/108 දරන පැමිණිල්ලට අදාළව කොළඹ වංචා විමර්ශන කාර්යාංශය, කොළඹ අපරාධ කොට්ඨාසය, නියෝජ්‍ය පොලිස්පති , ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් ඒවන ලද වාර්ථා, පොලිස් නිරීකෂණය, සටහන් නිර්දේෂ, යවනු ලැබූ ලිපි ඇතුලු සම්පූර්ණ ගොණුවේ සහතික පිටපත්.*

තොරතුරු නිලධාරි පනත ප්‍රකාරව නියමිත කාලය තුළ, පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019.10.25 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරිද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019.12.12 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2019.08.02 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2019.10.25 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි හට ද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරි හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරි සහ නම්කළ නිළධාරි විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

අභියාචක විසින් 2020.09.01 වන දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව වෙත දන්වා සිටියේ “පොදු අධිකාරිය මේ දක්වා මා වෙත තොරතුරු ප්‍රදානය නොකළ බව"යි.

එසේ වුවද, මෙම පොදු අධිකාරියේ මූලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ විසින් දින රහිත ලිපියක් 2019 වර්ෂයේ දෙසැම්බර් මස අභියාචක වෙත ඉදිරිපත් කර ඇත. එම ලිපියට අනුකූලව අභියාචක විසින් පොලිස් මූලස්ථාන මහජන සහන මැදිරිය වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලිවල පිටපත් ලබා ගැනීම සඳහා එම පැමිණිලි පිටපත් අවශ්‍ය කාරණය සඳහන් කර නැවත ලිපියක් ඉදිරිපත් කරන මෙන් දන්වා ඇත.

2022.01.31 දින අභියාචක විසින් කොමිෂන් සභාව වෙත ලිපියක් මගින් *අනු අංක ii ට අදාළ තොරතුරු පමණක් මේ වන විට පොදු අධිකාරිය විසින් ලබා දී ඇති බවත් එම නිසා අනෙකුත් තොරතුරු එනම්, අනු අංක i හා iii යටතේ ඉල්ලා ඇති තොරතුරු ලබා දෙන ලෙස* දක්වා ඇත.

පොදු අධිකාරිය විසින් 2021.03.20 දිනැති ලිඛිත කරුණු දැක්වීම මගින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

> *"2017.08.18 වන දින සී.අයි.බී. (02) 363/49 යටතේ ඉදිරිපත්කර ඇති පැමිණිල්ලට අදාළ විමර්ශන මේ වන විට අවසන්ව ඇති හෙයින් ඊට අදාළ විමර්ශන වාර්ථා වල පිටපත් බස්නාහිර පළාත හා රථවාහන භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා වෙතින් ඉල්ලුම් කර ලබාගත හැකි බවත්, එම පැමිණිල්ලේ පිටපතක් පොලිස් මූලස්ථාන මහජන සහන මැදිරිය වෙතින් 2021.03.17*

*වන දින අභියාචක විසින් ලබා ගෙන ඇති බවත්, එමෙන්ම 2018.09.01 දිනැති සී. අයි.බී. (02) 94/03 යටතේ ඉදිරිපත් කර ඇති පැමිණිල්ලෙහිද විමර්ශන කටයුතු අවසන්කර ඇති හෙයින් ඊට අදාළ විමර්ශන වාර්ථා වල පිටපත් බස්නාහිර පළාත හා රථවාහන භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙතින් ඉල්ලුම් කර ලබාගත හැකි බවත්, එම පැමිණිල්ලෙහි පිටපතක් පොලිස් මූලස්ථානය මහජන සහන මැදිරිය වෙතින් 2021.03.17 වන දින අභියාචක විසින් ලබා ගෙන ඇති බවත් තවද අභියාචක විසින් 2019.07.23 වන දින සී. අයි. බී (01) 342/108 යටතේ ඉදිරිපත් කර තිබෙන පැමිණිල්ල සම්බන්ධයෙන් වන විමර්ශන කටයුතු මෙතෙක් අවසන් කර නොතිබීමත් එය අපරාධමය ස්වරූපයකින් විමර්ශනය වෙමින් පැවතීමත් හේතුවෙන් ඊට අදාළ විමර්ශන වාර්තා වල පිටපත් හෝ පැමිණිල්ලේ පිටපත තොරතුරු දැනගැනීමේ පනතේ 05 වන වගන්තියේ උප (i) හා (ii) යටතේ පවතින තොරතුරු වලට ප්‍රවේශවීම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිපාදන යටතේ අභියාචක වෙත ලබාදීමේ හැකියාවක් නොපවතී."*

**සළකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24 වන වගන්තිය යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, පනතේ 31 වන වගන්තිය යටතේ අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

අද දින පරීක්ෂණයේදී අභියාචක විසින් කොමිෂන් සභාවේ අවධානය සඳහා නියෝජ්‍ය පොලිස්පති (කොළඹ දිසාව) ඩී.ජී.ජේ චන්ද්‍රකුමාර මහතා විසින් අභියාචක අමතන ලද 2022.06 වන මස දිනයක් රහිතව යවන ලද ලිපියක් ඉදිරිපත් කරයි. එකී ලිපියේ සඳහන් අන්දමට උක්ත තොරතුරු ඉල්ලීමේ දැක්වෙන තොරතුරු ලබා ගැනීම සඳහා 2022.06.15 වන දිනට ප්‍රථම, සතියේ දිනයක පෙ.ව 10.00 සිට ප.ව 2.00 දක්වා කාලය තුළ පැමිණ මුදල් ගෙවා ලබා ගන්නා ලෙසට දැනුම් දී ඇත.

මේ අනුව මෙම තොරතුරු මුදා හැරීම සඳහා පොදු අධිකාරිය විසින් පැහැදිලි නිගමනයකට එළඹ ඇති බව උක්ත සඳහන් ලිපියේ අන්තර්ගතය අනුව පෙනී යයි.

එසේ වුවත්, අද දින පරීක්ෂණයේදී කොමිෂන් සභාවේ අවධානය පිණිස යැයි සඳහන් කරමින් ලේඛන 2 ක ඡායා පිටපත් පොදු අධිකාරියේ උප පොලිස් පරීක්ෂක ඩබ්.ඩී ආරියසිංහ මහතා ඉදිරිපත් කර ඇත. එකී ලේඛනයන්හි අන්තර්ගතය ඉහතින් සඳහන් කරන ලද නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍රකුමාර මහතාගේ ලිපියෙහි අන්තර්ගතය හා මුළුමනින්ම එකිනෙකට ගැටේ. එසේ වුවත්, අද දින ඉදිරිපත් කරන ලද එකී ලේඛනයෙහි අන්තර්ගතයට කිසිදු නෛතික පදනමක් 2016 අංක 12 දරණ පනතේ 5 (1) වගන්තියේ විධිවිධාන තුළින් ලබා දී නොමැත. එබැවින්, එවැනි නෛතික පදනමක් රහිත කරුණු කියා පෑම් තොරතුරු මුදා හැරීම වාරණය කිරීම සඳහා අදාළ කර ගත නොහැකි වේ.

එබැවින්, මෙම කරුණු සළකා බලා පොදු අධිකාරිය වෙනුවෙන් අද දින කියා සිටිනු ලබන කරුණු කියා පෑම් නීතියෙන් ස්ථාපිත කළ නොහැකි බැවින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු.

ඒ අනුව, උක්ත සඳහන් තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත සියලුම තොරතුරු 2022.09.22 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

අභියාචක විසින් කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කිරීමෙන් පසුව 2022 වර්ෂයේ ජූනි මාසයේදී නියෝජ්‍ය පොලිස්පති (කොළඹ දිසාව) ඩී.ජී.ජේ චන්ද්‍රකුමාර මහතා විසින් යවනු ලබන ලිපියෙහි තොරතුරු ලබා ගැනීම සඳහා මුදල් ගෙවන ලෙසට දැනුම් දීමක් කර ඇත. තොරතුරු පනතේ විධිවිධාන අනුව කොමිෂන් සභාව වෙත අභියාචනයක් කිරීමෙන් පසුව තොරතුරු මුදා හැරීම සඳහා මුදල් ලබා ගැනීමේ හිමිකම පොදු අධිකාරියට අහිමි වේ. ඒ අනුව තොරතුරු මුදා හැරීම ගාස්තු අය කිරීමකින් තොරව සිදු කිරීමට පොදු අධිකාරියට සිදු වනු ලැබේ.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.